# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,507 - 2026 සැප්තැම්බර් මස 18 සිකුරාදා - 2026.09.18**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... | 1368 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — |
| බඳු බාහිරාදිය විකිණීම ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... | — |
| දේපළ විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | 1381 |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට්* පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට්* පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ඔක්තෝබර් මස 09 දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 සැප්තැම්බර් මස 25 දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට්* පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට්* පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# තනතුරු ඇබෑර්තු

## මොරටුව මහා නගර සභාව

මොරටුව මහා නගර සභාවේ ගිනි හට තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම.

මොරටුව මහා නගර සභාවේ ගිනිහට තනතුරුවල පවතින පුරප්පාඩු 03ක් සඳහා සුදුසු පුද්ගලයන් තෝරා ගැනීමට පහත සුදුසුකම් ඇති තැනැත්තන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙළ කරන ලද අයදුම්පත් 2026 ඔක්තෝබර් 17 දිනට හෝ ඊට පෙර නාගරික කොමසාරිස්, මහා නගර සභාව, මොරටුව යන ලිපිනය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරය වම්පස උඩ කෙළවරේ **"ගිනිහට තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම"** යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

**2. බඳවා ගැනීමේ සුදුසුකම්**

**2.1 අධ්‍යාපන සුදුසුකම්**

I. එකවරකදී සිංහල / දෙමළ භාෂාව හා ගණිතය ඇතුළුව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ ) විභාගය විෂයයන් හයකින් සමත්ව තිබිය යුතු අතර, එම අවස්ථාවේදීම හෝ තවත් එක් අතිරේක අවස්ථාවක දී විද්‍යාව හා ඉංග්‍රීසි විෂයයන්ද සමත්ව තිබිය යුතුය.

**2.2 කායික සුදුසුකම්**

I. උස සෙ.මී. 162කට නොඅඩු සහ ජෛව ස්කන්ධ දර්ශකය නියමිත පරිදි තිබිය යුතුය. (ජෛව ස්කන්ධ දර්ශකය 18.5 සිට 24 දක්වා විය යුතුය.

II. සෑම අපේක්ෂකයෙකුම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් යුත්ත විය යුතුය.

III. දෘෂ්ඨීය පිළිබඳ අවශ්‍යතාවයන් - උපැස් යුවලක් හෝ ස්පර්ශ කාච රහිත ඇස් පෙනීම අවම වශයෙන් 6/6 සහ 6/12 අතර ද වර්ණ පෙනීම ද සාමාන්‍ය විය යුතුය.

IV. කෘතිම ශාරීරික වෙනස්කම් කර නොතිබිය යුතුය. (උදා - පච්ච කොටා තිබීම වැනි)

**2.3 වෙනත් සුදුසුකම්**

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසර තුනක් (3) අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය තිබිය යුතුය.

III. අවිවාහක පිරිමි අයෙකු විය යුතුය.

IV. යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර, නීති විරෝධී ක්‍රියාවන්ට සම්බන්ධ නොවූ අයෙකු බව පොලිස් වාර්තාවකින් සනාථ කළ යුතුය.

V. තනතුරට බඳවා ගැනීම සඳහා නියම කර ඇති සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / *ගැසට්* පත්‍රයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**2.4 වයස**

I. වයස අවු 18ට නොඅඩු විය යුතු අතර 24ට නොවැඩි විය යුතුය.

**3. බඳවා ගැනීමේ ක්‍රමය**

I. නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයෙන් හා වෘත්තීය (ප්‍රායෝගික) පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු සඳහා ආධුනික ගිනි හටයින් වශයෙන් තෝරා ගනු ලැබේ.

II. පුහුණුව ආරම්භ කිරීමට පෙර සියළුම ආධුනික ගිනි හටයින් කායික, මානසික, යෝග්‍යතාවය තහවුරු කිරීම සඳහා වෛද්‍ය පරීක්ෂණයට භාජනය කරනු ලැබේ.

III. පුරප්පාඩු සඳහා තෝරා ගන්නා අයවලුන් එක් අවුරුදු ගිනිහට පුහුණු පාඨමාලාව හැදෑරිය යුතුය. පුහුණුකාල සීමාව තුළ දී වැඩ, හැසිරීම හා පැමිණීම සතුටුදායක නොවන හෝ අපේක්ෂිත රැකියා මට්ටමට ළගා නොවන ආධුනික ගිනිහටයන් කිසිම වන්දියකින් තොරව පුහුණුවෙන් ඉවත් කරනු ලැබේ.

IV. සාර්ථකව අදාළ පුහුණුව අවසන් කරන ආධුනික ගිනිහටයින් ගිනිහට තනතුර සඳහා ස්ථිරව බඳවා ගනු ලැබේ. පුහුණු කාල සීමාව ස්ථිර සේවා කාලය සඳහා ගණනය කරනු ලබන අතර, අදාළ වැටුප් පරිමාණයේ දෙවන පියවරේ තබනු ලැබේ.

V. පුහුණු කාල සීමාව තුළ මාසිකව රු: 10,000 /- ක දීමනාවක් ගෙවනු ලැබේ.

VI. පුහුණු කාල සීමාව තුළ දී කිසිම ආධුනික ගිනිහටයෙකුට විවාහ වීමට අවසර දෙනු නොලැබේ.

VII. පුහුණුවට තොරා ගන්නා ලද ආධුනික ගිනිහටයින් ස්ථිර තනතුරට පත්කිරීමෙන් අනතුරුව පත්කළ දින සිට වසර 05 ක කාල සීමාවක් අදාළ පළාත් පාලන ආයතනයේ සේවය කරන බවට පත්කිරීම් බලධරයා සමඟ රු: 500,000/- ක වටිනාකමකින් යුතු බැඳුම්කරයක් පුහුණුව ආරම්භ කරන අවස්ථාවේ දී අත්සන් කළ යුතුය.

VIII. ආධුනිකයාගේ අභිමතය පරිදි පුහුණු කාලය තුළ පුහුණුවෙන් ඉවත් වන්නේ නම්, පුහුණුවට වැය වූ සියලුම වියදම් ආයතනය වෙත ගෙවීමට කටයුතු කළ යුතුය.

IX. ගිනිහට තනතුර සඳහා පත්වීම් ලැබූ පත්වීම්ලාභීන් අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශයේ පදිංචි වන ලෙස නියම කළ හැකිය.

**4. වැටුප් කාණ්ඩය සහ පරිමාණය**

වැටුප් කේත අංකය : RS1 - 2025

වැටුප් පරිමාණය : රු. 49,550 7x540 – 27x670 - රු. 71,420/-

5. ලිඛිත පරීක්ෂණය

I. බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි ගිනිහට තනතුර සඳහා බඳවා ගැනීම සඳහා වන ලිඛිත පරීක්ෂණය පිළිබඳ විස්තර

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *අවම සමත් ලකුණු* |
|---|---|---|---|
| සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |

II. විභාගය සඳහා වන විෂයය නිර්දේශය

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂයය නිර්දේශය* |
|---|---|
| සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | ජාතික කලාපීය හා ලෝකයේ විවිධ සංවිධාන පරිසරයන් තුළ පවතින සමාජීය, සංස්කෘතික, අධ්‍යාපනික, විද්‍යාත්මක, දේශපාලනමය, ආර්ථික හා අනෙකුත් අදාළ සාධකයන් සම්බන්ධව මෙන්ම විද්‍යාත්මක හා කාර්මික සංවර්ධන සම්බන්ධයෙන් ඇති දැනුම, තර්කන ශක්තිය, ගණිත කුසලතාවයන්, තාර්කික තීරණ ගැනීම හා කාලය කළමනාකරණය කිරීම, පරීක්ෂා කිරීම සඳහා සකස් වූ ප්‍රශ්න පත්‍රයකි. |

**6. වෘත්තීය පරීක්ෂණය**

I. ලිඛිත පරීක්ෂණය සමත් අයදුම්කරුවන් පමණක් වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

II. වෘත්තීය පරීක්ෂණයට සහභාගී වීමට පෙර අයදුම්කරුවන් තම ශාරීරික යෝග්‍යතාවය පිළිබඳ රජයේ ලියාපදිංචි වෛද්‍යවරයෙකුගෙන් ලබා ගත් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

III. බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන ආයතනවල ගිනි නිවීම් සේවා ඒකකයන්හි ගිනිහට තනතුර සඳහා බඳවා ගැනීම සඳහා වන වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර (ප්‍රායෝගික)

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *අවම සමත් ලකුණු* |
|---|---|---|---|
| දරා ගැනීමේ හැකියාව | අදාළ වන පරිදි | 60 | 36 |
| සමබරතාව | අදාළ වන පරිදි | 40 | 24 |

IV. විභාගය සඳහා වන විෂය නිර්දේශය

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| දරා ගැනීමේ හැකියාව | 1. දිවීම<br>(කිලෝ මීටර් 01ක් දුර දිවීමට ගත වන අවම කාලය අනුව ප්‍රමුඛතාවය) |
| | 2. ඩිප්ස් ගැසීම (නිවැරදි ව ඩිප්ස් 25ක් ගැසීමට ගත වන අවම කාලය ) |
| | 3. බර ඔසවා ගෙන යාම |
| සමබරතාව | i. ඉනිමගේ යාම |
| | ii. කඹයෙන් බැසීම |

| 7. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය | |
|---|---|
| I. | ලිඛිත හා වෘත්තීය පරීක්ෂණය සමත් පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. |
| II. | සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී මූලික සුදුසුකම් පරීක්ෂා කර බලනු ලබන අතර ලකුණු ලබා දීමක් සිදු නොකෙරේ. |
| III. | ලිඛිත හා වෘත්තීය පරීක්ෂණය සමත්ව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවන ලද අයදුම්කරුවෙකු /අයදුම්කරුවන් මූලික සුදුසුකම් සපුරා නොමැති බව සම්මුඛ පරීක්ෂණයේ දී අනාවරණය වුවහොත් එම අයදුම්කරුවන් පත්වීම් ලැබීමට නුසුදුස්සන් බවට පත්වන අතර එම නුසුදුස්සන්බවට පත්වන සංඛ්‍යාවට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් කුසලතා අනුපිළිවෙළට අනුව සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. |
| IV. | කිසියම් අයදුම්කරුවකු සම්මුඛ පරීක්ෂණයට කැඳවූ පමණින් හෝ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි පමණින් එම අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා සුදුස්සෙකු ලෙස සලකනු නොලැබේ. |

8. භාෂා ප්‍රවීණතාවය

| **භාෂාව** | **ලබා ගත යුතු ප්‍රවීනතාවය** |
|---|---|
| රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යකින් සේවයට බැඳුන නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීනතාවය පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ විධිවිධාන අනුව අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. |
| සන්ධාන භාෂාව | අදාළ නොවේ. |

**9. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :**

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. බඳවා ගනු ලබන සේවකයින් වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

II. මෙම තනතුරට බඳවා ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලටද, බස්නාහිර පළාත් සභා මුල්‍ය රීති සංග්‍රහයටද, කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි හා නියෝග වලටද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන රෙගුලාසි හා නියෝග වලටද අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝග වලටද මොරටුව මහා නගර සභාවේ නාගරික කොමසාරිස් කලින් කල පනවනු ලබන නියමයන්ට හා රෙගුලාසිවලටද යටත්ව සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

**10. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය**

I. අයදුම්පත් 2026.10.17 දිනට හෝ ඊට ප්‍රථම නාගරික කොමසාරිස්, මහා නගර සභාව, මොරටුව යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුවේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

II. ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

III. අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "ගිනිහට තනතුර සඳහා බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම " යනුවෙන් සඳහන් කළ යුතුය.

IV. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය.

V. මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම් ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

**11. සාවද්‍ය තොරතුරු සැපයීම**

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍යය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

12. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීම සම්බන්ධයෙන් ද මෙහි රෙගුලාසි සලසා නොමැති කරුණු පිළිබඳව ද තීරණය ගැනීමේ බලය මොරටුව මහා නගර සභාව සතු වේ.

13. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේය.

**එල්. පී. මනෝජා එස් පතිරණ,**
නාගරික කොමසාරිස්,
මොරටුව මහා නගර සභාව.

2026 සැප්තැම්බර් මස 18 වැනි දින
මොරටුව මහා නගර සභාවේ දී ය.

*ආදර්ශ අයදුම්පත්‍රය*

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මොරටුව මහා නගර සභාවේ ගිනිහට තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම**

1. මුලකුරු සමඟ නම :
2. සම්පූර්ණ නම :
3. ස්ථිර ලිපිනය :
4. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :
5. ජාතික හැඳුනුම්පත් අංකය :
6. දුරකථන අංකය :
7. උපන් දිනය : අවුරුද්ද ........... මාසය ............. දිනය .............
8. අයදුම්පත් භාරගන්නා දිනට වයස : අවුරුදු........... මාස ............. දින .............
9. ස්ත්‍රී / පුරුෂ භාවය :
10. විවාහක / අවිවාහක බව :
11. ශ්‍රී ලංකා පුරවැසියෙක්ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචියෙන්ද?
12. **අධ්‍යාපන සුදුසුකම් :**

    1. සිංහල භාෂාව ............... 6. ඉංග්‍රීසි .................
    2. ගණිතය ............... 7. සෞන්දර්ය ............
    3. බුද්ධ ධර්මය ............. 8. ව්‍යාපාර අධ්‍යයනය හා ගිණුම්කරණය.....................
    4. සමාජ අධ්‍යයනය ................. 9. ..............................
    5. විද්‍යාව........... 10. ...........................

    (අ.පො.ස. සා.පෙළ විභාග සහතිකය අමුණා තිබිය යුතුය.)

13. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :
14. වෙනත් සුදුසුකම් : :
15. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවකු කරනු ලැබ තිබේද?

    මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සකු වන බව හා පත්වීම් ලැබීමෙන් පසුව ඔප්පු වුවහොත් කිසිඳු වන්දියක් රහිතව සේවයෙන් පහ කිරීමට යටත් වන බවද දනිමි.

    ....................................,
    අයදුම්කරුගේ අත්සන

    දිනය :.....................................

16. **දැනට රාජ්‍ය සේවයේ නියුක්තව සිටින අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය :**

    මෙම ඉල්ලුම්කරු වන ......................................................... මහතා මෙම ආයතනයේ .................................වශයෙන් සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු සේවයෙන් නිදහස් කළ හැකි / නොහැකි බවත්, ඔහු කුමන ආකාරයක හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

    ..................................................,
    ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :
නම :
තනතුර :
නිල මුද්‍රාව :

09-162/1

**මොරටුව මහා නගර සභාව**

මොරටුව මහා නගර සභාවේ ප්‍රාථමික - අර්ධ ශිල්පීය සේවා ගණයේ තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම

(විවෘත පදනමින්)

මොරටුව මහා නගර සභාවේ ප්‍රාථමික - අර්ධ ශිල්පීය සේවා ගණයේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා (විවෘත පදනමින්) සඳහා සුදුසු පුද්ගලයන් තෝරා ගැනීමට පහත සුදුසුකම් ඇති තැනැත්තන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. විදුලි කාර්මික III ශ්‍රේණියේ පුරප්පාඩු 01
2. ආදාහනාගාර ක්‍රියාකරු III ශ්‍රේණියේ පුරප්පාඩු 01

ඉහත තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති පුද්ගලයන් මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙළ කරන ලද අයදුම්පත් 2026.10.17 දිනට හෝ ඊට පෙර නාගරික කොමසාරිස්, මොරටුව මහා නගර සභාව, මොරටුව යන ලිපිනය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරය වම්පස උඩ කෙළවරේ **" විදුලි කාර්මික / ආදාහනාගාර ක්‍රියාකරු තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම"** යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

**2. බඳවා ගැනීමේ සුදුසුකම් :**

2.1 බඳවා ගන්නා ශ්‍රේණිය :- III ශ්‍රේණිය

2.2 අධ්‍යාපන සුදුසුකම් :-

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත්වී තිබීම. (මින් විෂයන් පහක් (05) එකවර සමත් වී තිබිය යුතුයි.)

2.3 වෘත්තීය සුදුසුකම් :-

අදාළ තනතුරට නියමිත පරිදි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි (N.V.Q) අවම වශයෙන් දෙවන මට්ටමේ නිපුණතාවයක් ලබා ගෙන තිබීම හා අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ මාස 06කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම. (සහතික මඟින් සනාථ කළ යුතුය.)

2.4 පළපුරුද්ද :- අදාළ නොවේ.

2.5 කායික සුදුසුකම් :-

සෑම අයදුම්කරුවෙකුම අදාළ තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

2.6 වෙනත් සුදුසුකම් :-

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

III. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය

IV. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ /*ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට මෙම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

2.7 වයස් සීමාව :-

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

3. **බඳවා ගැනීමේ ක්‍රමය**

3.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :-

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගැනේ.

**ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පිළිබඳ විස්තර**

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| බඳවා ගැනීමේ දී අවශ්‍ය මූලික අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් :<br>**අධ්‍යාපන සුදුසුකම් :**<br>බඳවා ගැනීමේ මූලික අධ්‍යාපන සුදුසුකම ලෙස දක්වා ඇති අ.පො.ස. (සා. පෙළ) විභාගයේදී සාමාර්ථ ලබා ගෙන ඇති විෂයයන් හය හා සම්මාන දෙකට අමතරව සමත්ව ඇති විෂයයන් සඳහා ලබා ඇති සාමාර්ථ සඳහා විෂයයන් දෙකක උපරිමයකට යටත්ව ලකුණු ලබා දේ | 20 | 50% |
| සාමාන්‍ය සමාර්ථයට - ලකුණු - 04<br>සම්මාන සමාර්ථයට - ලකුණු - 06<br>අධි සම්මාන සමාර්ථයට - ලකුණු - 08<br>විශිෂ්ඨ සම්මානයට - ලකුණු - 10 | | |
| සාමාන්‍ය දැනීම :<br>ආර්ථික, සමාජයීය, අධ්‍යාපන, විද්‍යාත්මක, සංස්කෘතික, දේශපාලනික මෙන්ම ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ දේශීය විදේශීය වශයෙන් වැදගත් වන්නාවූ කාලීන සිද්ධීන් පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම මැනීම සඳහා සකස් කෙරෙන ප්‍රශ්නවලින් යුක්ත වේ. | 75 | |
| පෞරුෂත්වය<br>සේවකයා සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන ආකාරය හා වෙනත් කරුණු සලකා බැලීම | 05 | |

**3.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :-**

මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී සිදු කරනු ලැබේ.

4. වැටුප් කාණ්ඩය සහ පරිමාණය :

වැටුප් කේත අංකය : PL2 - 2025

වැටුප් පරිමාණය : රු. 41,800- 10x490 – 10x540 –10x 590 -12X 630 - රු. 65,560/-

5 . භාෂා ප්‍රවීණතාවය :

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාවය |
|---|---|
| අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ විධිවිධාන අනුව අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. |
| සන්ධාන භාෂාව | අදාළ නොවේ. |

6. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. බඳවා ගනු ලබන සේවකයින් වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

II. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය.

III. මෙම තනතුරට බඳවා ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, බස්නාහිර පළාත් සභා මුල්‍ය රීති සංග්‍රහයට ද, කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි හා නියෝග වලටද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන රෙගුලාසි හා නියෝගවලට ද, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝගවලට ද, මොරටුව මහා නගර සභාවේ නාගරික කොමසාරිස් කලින් කල පනවනු ලබන නියමයන්ට හා රෙගුලාසිවලට ද යටත්ව සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

**07. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :**

I. අයදුම්පත් 2026.10.17 දිනට හෝ ඊට ප්‍රථම නාගරික කොමසාරිස්, මහා නගර සභාව, මොරටුව යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුවේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

II. ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

III. අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ " විදුලි කාර්මික / ආදාහනාගාර ක්‍රියාකරු තනතුර සඳහා බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම " යනුවෙන් සඳහන් කළ යුතුය.

IV. මේ සමඟ ඇති ආදර්ශ අයදුම් පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම් ගැන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

**08. සාවද්‍ය තොරතුරු සැපයීම :**

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍යය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

09. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීම සම්බන්ධයෙන් ද, මෙහි රෙගුලාසි සලසා නොමැති කරුණු පිළිබඳව ද තීරණය ගැනීමේ බලය මොරටුව මහා නගර සභාව සතු වේ.

10. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවත්විය යුතු වන්නේය.

එල්.පී. මනෝජා එස්. පතිරණ,
නාගරික කොමසාරිස්,
මොරටුව මහා නගර සභාව.

2026 සැප්තැම්බර් මස 18 වන දින
මොරටුව මහා නගර සභාවේදීය.

*ආදර්ශ අයදුම්පත්‍රය*

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මොරටුව මහා නගර සභාවේ විදුලි කාර්මික / ආදාහනාගාර ක්‍රියාකරු III ශ්‍රේණියේ තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම**

1. මුලකුරු සමඟ නම :
2. සම්පූර්ණ නම :
3. ස්ථිර ලිපිනය :
4. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :
5. ජාතික හැඳුනුම්පත් අංකය :
6. දුරකථන අංකය :
7. උපන් දිනය : අවුරුද්ද ............ මාසය .............. දිනය ..............
8. අයදුම්පත් භාරගන්නා දිනට වයස : අවුරුදු ............ මාස . ............. දින ..............

9. ස්ත්‍රී /පුරුෂභාවය :

10. විවාහක / අවිවාහක බව :

11. ශ්‍රී ලංකා පුරවැසියෙක්ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචියෙන් ද?

12. **අධ්‍යාපන සුදුසුකම් :**

| | |
|---|---|
| 1. සිංහල භාෂාව ............... | 6. ඉංග්‍රීසි .................. |
| 2. ගණිතය ............... | 7. සෞන්දර්ය................. |
| 3. බුද්ධ ධර්මය .............. | 8. ව්‍යාපාර අධ්‍යයනය හා ගිණුම්කරණය ............ |
| 4. සමාජ අධ්‍යයනය ................. | 9. ............................... |
| 5. විද්‍යාව........... | 10. ............................ |

(අ.පො.ස. සා.පෙළ විභාග සහතිකය අමුණා තිබිය යුතුය.)

13. වෘත්තීය සුදුසුකම් :

(NVQ 02 මට්ටමට අදාළ සහතිකය අමුණා තිබිය යුතුය.)

14. වෙනත් සුදුසුකම් : :

15. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවකු කරනු ලැබ තිබේද?

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සකු වන බව හා පත්වීම් ලැබීමෙන් පසුව ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් රහිතව සේවයෙන් පහ කිරීමට යටත් වන බව ද දනිමි.

......................................
අයදුම්කරුගේ අත්සන

දිනය :......................................

16. **දැනට රාජ්‍ය සේවයේ නියුක්තව සිටින අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය :**

මෙම ඉල්ලුම්කරු වන .......................................................... මහතා මෙම ආයතනයේ .................................වශයෙන් සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු සේවයෙන් නිදහස් කළ හැකි / නොහැකි බවත්, ඔහු කුමන ආකාරයක හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

...................................................
ආයතන ප්‍රධානියාගේ අත්සන

දිනය :

නම :

තනතුර :

නිල මුද්‍රාව :

09-162/2

**මොරටුව මහා නගර සභාව**

මොරටුව මහා නගර සභාවේ බර යන්ත්‍රෝපකරණ ක්‍රියාකරු තනතුරු සඳහා (විවෘත) අයදුම්පත් කැඳවීම

මොරටුව මහා නගර සභාවේ බර යන්ත්‍රෝපකරණ ක්‍රියාකරු III ශ්‍රේණියේ තනතුරෙහි පවතින පුරප්පාඩු 08ක් (විවෘත පදනමින් ) සඳහා සුදුසු පුද්ගලයන් තෝරා ගැනීමට පහත සුදුසුකම් ඇති තැනැත්තන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ඉහත තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති පුද්ගලයන් මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙළ කරන ලද අයදුම්පත් 2026.10.17 දිනට හෝ ඊට පෙර නාගරික කොමසාරිස්, මොරටුව මහා නගර සභාව, මොරටුව යන ලිපිනය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරය වම්පස උඩ කෙළවරේ **" බර යන්ත්‍රෝපකරණ ක්‍රියාකරු තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම"** යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

**2. බඳවා ගැනීමේ සුදුසුකම් :**

2.1 බඳවා ගන්නා ශ්‍රේණිය :- III ශ්‍රේණිය

2.2 අධ්‍යාපන සුදුසුකම්

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිතව විෂයයන් 06ක් සමත්ව තිබිය යුතුය. (මින් විෂයන් පහක් (05) එකවර සමත් වී තිබිය යුතුයි.)

**2.3 වෘත්තීය සුදුසුකම් :-**

I. බර වාහන රියදුරු බලපත්‍රය (තාර බර හොන්ඩර් 34 වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32ට වඩා ගෙන යා හැකි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද නිපුණතාවය පිළිබඳ සහතිකයක් හෝ ‘‘ඒ’’ පන්තියේ බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව ‘‘ඩී’’ පන්තියේ බලපත්‍රයක්) ලබා තිබිය යුතුය.

II. අවම උස අඩි 5ක් විය යුතුය

III. බර යන්ත්‍ර / ගල් රෝල් ක්‍රියාකරවීම පිළිබඳව තෘයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවෙන් නිකුත් කරන ලද NVQ 04 මට්ටමට අදාළ සහතිකපතක් තිබිය යුතුය.

IV. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳව මූලික අවබෝධයක් තිබිය යුතුය.

**2.4 පළපුරුද්ද :-**

බර යන්ත්‍රෝපකරණ / ගල් රෝල් ක්‍රියාකරවීම පිළිබඳව එක් වසරක පළපුරුද්දක් ලබා තිබීම.

**2.5 කායික සුදුසුකම් :-**

සෑම අයදුම්කරුවෙකුම බස්නාහිර පළාතේ ඕනෑම දිස්ත්‍රික්කයක සේවය කිරීටමත් තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

**2.6 වෙනත් සුදුසුකම් :-**

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. යහපත් චරිකයකින් යුක්ත විය යුතුය.

III. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

IV. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / *ගැසට්* පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට මෙම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**2.7 වයස :-**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

**3. බඳවා ගැනීමේ ක්‍රමය :**

3.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :-

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගැනේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේ දී සලකා බලනු ලබන අවශ්‍යතා ද මෙහිදී සලකා බැලේ.

**ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පිළිබඳ විස්තර :**

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| මාර්ග නීති පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම | 30 | 50% |
| යාන්ත්‍රික ක්‍රියාකාරිත්වය හා එහි පැවැත්ම පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම | 50 | |
| ප්‍රායෝගික පරීක්ෂණය<br>බඳවා ගැනීමට යෝජිත බර යන්ත්‍රෝපකරණ ක්‍රියාකරවීම පිළිබඳ අයදුම්කරුගේ ශිල්පීය හැකියාව හා ප්‍රවීණතාව මෙහිදී පරීක්ෂා කරනු ලැබේ. | 15 | |
| පෞරුෂත්වය<br>සේවකයා සම්මුඛ පරීක්ෂණයට මුහුණ දෙන ආකාරය මෙහිදී පරීක්ෂා කරනු ලැබේ. | 05 | |

3.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :-

මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී සිදු කරනු ලැබේ.

4. වැටුප් කාණ්ඩය සහ පරිමාණය :

වැටුප් කේත අංකය : PL 3 - 2025

වැටුප් පරිමාණය : රු. 42,780- 10x490 – 10x540 – 10X590 – 12X630 - රු. 66,540/-

5. භාෂා ප්‍රවීණතාවය :

| *භාෂාව* | *ලබා ගත යුතු ප්‍රවීණතාවය* |
|---|---|
| දෙවන භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට ආනුෂංගික චක්‍රලේඛ විධිවිධාන අනුව අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය. |
| සන්ධාන භාෂාව | අදාළ නොවේ. |

**6. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :**

I. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. බඳවා ගනු ලබන සේවකයින් වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

II. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත් තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතුය.

III. මෙම තනතුරට බඳවා ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයට ද, කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි හා නියෝගවලට ද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන රෙගුලාසි හා නියෝගවලට ද අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝගවලට ද මොරටුව මහා නගර සභාවේ නාගරික කොමසාරිස් කලින් කළ පනවනු ලබන නියමයන්ට හා රෙගුලාසිවලට ද යටත්ව සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

**7. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :**

I. අයදුම්පත් 2026.10.17 දිනට හෝ ඊට ප්‍රථම නාගරික කොමසාරිස්, මහා නගර සභාව, මොරටුව යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුවේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

II. ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර තමාගේ අත් අකුරින් සම්පූර්ණ කළ යුතුය.

III. අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ " බර යන්ත්‍රෝපකරණ ක්‍රියාකරු තනතුර සඳහා බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම " යනුවෙන් සඳහන් කළ යුතුය.

IV. මේ සමඟ ඇති ආදර්ශ අයදුම් පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම් ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

**08. සාවද්‍ය තොරතුරු සැපයීම**

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍යය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

09. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීම සම්බන්ධයෙන් ද මෙහි රෙගුලාසි සලසා නොමැති කරුණු පිළිබඳව ද තීරණය ගැනීමේ බලය මොරටුව මහා නගර සභාව සතු වේ.

10. මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේය.

එල්. පී. මනෝජා එස් පතිරණ,
නාගරික කොමසාරිස්,
මොරටුව මහා නගර සභාව.

2026 සැප්තැම්බර් මස 18 වන දින,
මොරටුව මහා නගර සභාවේ දී ය.

*ආදර්ශ අයදුම්පත්‍රය*

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මොරටුව මහා නගර සභාවේ බර යන්ත්‍රෝපකරණ ක්‍රියාකරු III ශ්‍රේණියේ තනතුරු සඳහා අයදුම් පත් කැඳවීම**

1. මුලකුරු සමඟ නම :
2. සම්පූර්ණ නම :
3. ස්ථිර ලිපිනය :
4. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :
5. දුරකථන අංකය :
6. ජාතික හැඳුනුම්පත් අංකය :
7. උපන් දිනය : අවුරුද්ද ............ මාසය .............. දිනය ..............

8. අයදුම්පත් භාරගන්නා දිනට වයස : අවුරුදු ........... මාස ............. දින .............
9. ස්ත්‍රී /පුරුෂභාවය :
10. විවාහක / අවිවාහක බව :
11. ශ්‍රී ලංකා පුරවැසියෙක්ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචියෙන්ද?

12. **අධ්‍යාපන සුදුසුකම් :**

1. සිංහල භාෂාව ............... 6. ඉංග්‍රීසි ..................
2. ගණිතය ............... 7. සෞන්දර්ය.................
3. බුද්ධ ධර්මය .............. 8. ව්‍යාපාර අධ්‍යයනය හා ගිණුම්කරණය .........................
4. සමාජ අධ්‍යයනය ................. 9. ...............................
5. විද්‍යාව........... 10. ............................

(අ.පො.ස. සා.පෙළ විභාග සහතිකය අමුණා තිබිය යුතුය.)

13. වෘත්තීය සුදුසුකම් :

(NVQ 04 මට්ටමට අදාළ සහතිකය අමුණා තිබිය යුතුය.)

14. පළපුරුද්ද :

15. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවකු කරනු ලැබ තිබේද?

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සකු වන බව හා පත්වීම් ලැබීමෙන් පසුව ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් රහිතව සේවයෙන් පහ කිරීමට යටත් වන බවද දනිමි.

......................................
අයදුම්කරුගේ අත්සන

දිනය :......................................

16. **දැනට රාජ්‍ය සේවයේ නියුක්තව සිටින අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය :**

මෙම ඉල්ලුම්කරු වන ......................................................... මහතා මෙම ආයතනයේ .................................වශයෙන් සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු සේවයෙන් නිදහස් කළ හැකි / නොහැකි බවත්, ඔහු කුමන ආකාරයක හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

....................................................
ආයතන ප්‍රධානියාගේ අත්සන

දිනය :
නම :
තනතුර :
නිල මුද්‍රාව :

09-162/3

# විවිධ දැන්වීම්

**බුලත්සිංහල ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂයේ ත්‍රීරෝද රථ නැවතුම්පළ ත්‍රීරෝද රථ සංඛ්‍යාව වැඩි කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ බුලත්සිංහල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2026 වර්ෂයේ සැප්තැම්බර් මස 18 වන දා සිට හල්වතුර වත්තෙකඩේ හන්දිය ත්‍රී රෝද රථ නැවතුම්පළෙහි නවතා තැබිය හැකි ත්‍රී රෝද රථ සංඛ්‍යාව දහය දක්වා වැඩි කිරීම විය යුතු බවට 2026.07.07 දින සභා තීරණ අංක (ඊ).I.VI. යටතේ තීරණය කරමි.

පී. ඩී. සංජීව පුෂ්පකුමාර,
සභාපති,
ප්‍රාදේශීය සභාව බුලත්සිංහල.

09-156/1

---

**බුලත්සිංහල ප්‍රාදේශීය සභාව**

2026 වර්ෂයේ නව ත්‍රීරෝද රථ නැවතුම්පළ ස්ථාපනය කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන යටතේ බුලත්සිංහල ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බලතල ප්‍රකාරව 2026 වර්ෂයේ සැප්තැම්බර් මස 18 වන දා සිට කෝන්ගස්තැන්න ග්‍රාම නිලධාරි කාර්යාලය අසල ත්‍රී රෝද රථ දහයක් නවතා තැබිය හැකි නව ත්‍රී රෝද රථ නැවතුම්පළක් ස්ථාපනය කිරීම විය යුතු බවට 2026.07.07 දින සභා තීරණ අංක (ඊ).I.VII. යටතේ තීරණය කරමි.

පී. ඩී. සංජීව පුෂ්පකුමාර,
සභාපති,
ප්‍රාදේශීය සභාව බුලත්සිංහල.

09-156/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.